# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.elections.gov.lk*
*e-mail : info@elections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය :LAE/2019/09 | ඔබේ අංකය : | දිනය : 2019.09.03 |
| எனது இல. | உமது இல. | திகதி |

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු/**
**පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/**
**ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ කොමිෂන් සභා ලේකම්වරු/**
**රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,**

**ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම - 2019**
**තැපෑලෙන් ඡන්දය දීම.**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 39 ආ (3) වැනි වගන්තිය හා 12/2018 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් නිකුත් කරන ලද 2139/13 හා 2019.09.02 දිනැති ගැසට් පත්‍රය අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ, ඡන්ද විමසීම් දැන්වීම පළ කළ දිනට පසු දින 10 ක් වූ කාලසීමාවක් තුළ තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලැබූ සියලුම ඡන්දහිමියන් තම තැපැල් ඡන්ද අයදුම්පත තමාගේ කාර්යාලයේ ආසන්නතම ප්‍රධානියාගේ සහතිකය සමඟ සහතික කිරීමේ නිලධාරී මගින් ගාල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත යැවිය යුතු ය. ඒ අනුව තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය වූ **2019.09.13 දින පැය 12.00**ට හෝ ඊට පෙර තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ අයදුම්පත් ගාල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

## 02. තැපැල් ඡන්ද අයදුම්පත් යැවිය යුතු ලිපිනය

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් තමාට ලැබෙන තැපැල් ඡන්ද අයදුම්පත් අදාළ ඡන්ද හිමියාගේ ආසන්නතම ප්‍රධානියාගේ සහතිකය සමඟ ලැබී ඇති බවට නිසැක විය යුතු අතර, සහතික කිරීමේ නිලධාරී වශයෙන් තමාගේ නම සහ රාජකාරී ලිපිනය සහිත නිල මුද්‍රාව සහ අත්සන තබා සහතික කළ යුතු ය. ඡන්දහිමියා සහතික කිරීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන අවස්ථාවක තමාටම තම අයදුම්පත සහතික කළ හැකි ය.

සහතික කරනු ලබන තැපැල් ඡන්ද අයදුම්පත් එදිනම හෝ ඊට පසු දින නොවරදවාම ගාල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත තැපැල් මගින් යැවිය යුතු ය. මේ සඳහා නිදහස් තැපැල් පහසුකම් ලබා දෙනු ලබන බැවින් මුද්දර ඇලවීමක් අවශ්‍ය නොවේ. "**ප්‍රමුඛ සේවා**" ලේබලය හෝ එම වගන්තිය ලිපි කවරයෙහි පැහැදිලිව සටහන් කිරීම ප්‍රමාණවත් වේ. සහතික කරන ලද තැපැල් ඡන්ද අයදුම්පත් යැවිය යුතු ලිපිනය පහත දක්වා ඇත.

2.1 තේරීම්භාර නිලධාරී
ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

## 03. ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය

තැපැල් ඡන්ද දායකයින්ගේ පහසුව සඳහා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තැපැල් ඡන්ද නාමලේඛන පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කර ඇත.

1. ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය
2. ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. ඇල්පිටිය ප්‍රාදේශීය සභා කාර්යාලය
4. ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල (ඒ ඒ කොට්ඨාසයට අයත් නාමලේඛන කොටස)

තවද මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට (elections.gov.lk) පිවිස එහි මුල් පිටුවේ ඇති (පාලන ආයතන ඡන්ද විමසීමට අදාල නාමලේඛනය සබැඳිය "2018 ඡන්දහිමි නාමලේඛනය" වෙත ගොස් එහි සඳහන් උපදෙස් පරිදි ස්වකීය ජාතික හැඳුනුම්පත් අංකය අනුසාරයෙන් තැපැල් ඡන්ද අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා වූ තොරතුරු ලබා ගත හැකිය .

මීට අමතරව ඡන්දහිමියන් සමූහයක තොරතුරු අවශ්‍ය වන අවස්ථාවලදී මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සඳහන් තැපැල් ඡන්ද තොරතුරු ලබා ගැනීමේ ආකෘතිය සම්පූර්ණ කර මැතිවරණ කොමිෂන් සභාවේ අංක 0112868426 වෙත ෆැක්ස් මගින් හෝ it@elections.gov.lk යන ඉ -තැපැල් ලිපිනයට ද එවීමෙන් තැපැල් ඡන්දදායකයින්ට අදාළ තොරතුරු ලබා ගත හැකි ය.

**මෙම ඡන්ද විමසීම සඳහා භාවිතා කරනු ලබන්නේ 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය බැවින් පසුගිය ඡන්ද විමසීම්වල දී එක් රැස්කර ගත් තොරතුරු මත තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ නොකළ යුතු වේ. (තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කළ යුත්තේ ඇල්පිටිය ප්‍රා දේශීය සභාව සඳහා පිළියෙළ කළ 2018 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයෙන් පමණි.)**

**එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයෙකුලවා පරීක්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වලකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**04.** තැපැල් ඡන්ද සඳහා හිමිකම් ඇති අය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 39 වගන්තිය අනුව තැපැල් ඡන්ද හිමිකම් ලබා ඇති නිලධරයන් සහ සේවකයන් වෙනුවෙන් තැපැල් ඡන්ද පහසුකම් ලබා දිය යුතු වේ. ඒ අනුව ඔබ දෙපාර්තමේන්තුවෙහි, ආයතනයෙහි නිලධරයන්, සේවකයන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත්, තමාගේ තැපැල් ඡන්ද අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පතෙහි පසුපිට ඇති උපදෙස් කියවා බලන ලෙසත් 2018 ඡන්දහිමි නාමලේඛනයෙහි තමාගේ ලියාපදිංචි තොරතුරු අනුව තැපැල් ඡන්ද අයදුම්පත සම්පූර්ණ කරන ලෙසත් අනතුරුව ආරක්ෂක පියවරක් වශයෙන් මෙවර අයදුම්පත මගින් හඳුන්වා දී ඇති පරිදි තමාගේ ආසන්නතම ප්‍රධානියා වෙත ඉදිරිපත් කර, තමාගේ සහතිකය ලබා ගත යුතු බවත්, ඉන් පසු තමාගේ තැපැල් ඡන්ද අයදුම්පත සහතික කිරීමට පත් කර ඇති සහතික කිරීමේ නිලධාරි වෙත භාර දිය යුතු බවටත් උපදෙස් දිය යුතුය.

39(ආ)(2) වගන්තිය
තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන්

4.1 රාජකාරි හේතුවෙන් තමන්ට නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්, ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්

4.2 රාජකාරි හේතුවෙන් නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්

4.3 රාජකාරි හේතුවෙන් නියමිත ඡන්ද පොළේ ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්

4.4 රාජකාරි හේතුවෙන් නියමිත ඡන්ද පොළේ ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්

4.5 රාජකාරි හේතුවෙන් නියමිත ඡන්ද පොළේ ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයින්

4.6 අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ දී ඡන්දය දීමට ඉඩක් නොලබන අපේක්ෂකයින්

4.7 ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද විමසීම හා සම්බන්ධ කාර්යයන් සඳහා නියුක්ත කිරීමට අපේක්ෂිත පළාත් පාලන, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සේවයේ නිලධාරීන් හා සේවකයින්

4.8 ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුභවතුන්

## 05. සහතික කිරීමේ නිලධාරීන්

ඔබ ආයතනයෙහි තැපැල් ඡන්දහිමියන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අවශ්‍ය සහතික කිරීමේ නිලධාරීන් සංඛ්‍යාවක් පත් කළ යුතුය. එම පත් කිරීම් සඳහා අවශ්‍ය පත්වීම් ලිපියක ආදර්ශයක් යා කර ඇත. මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද උපදෙස් පන්ති පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු හෙයින් පසුගිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද උපදෙස් පන්තියකට සහභාගී වී කටයුතු කර ඇති පළපුරුදු නිලධාරීන් සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ඇතැම් සහතික කිරීමේ නිලධාරීන් තමා වෙත පැවරෙන කාර්යයේ වගකීම පිළිබඳ අවබෝධයක් නොමැති කම නිසා තැපැල් ඡන්ද කටයුතුවලදී සිදු කරනු ලබන අඩු පාඩු දක්නට ලැබේ. මේවා නැවත නිවැරදි කිරීමට අවකාශ නොලැබෙනු ඇත. එබැවින් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීමේ දී ආයතන ප්‍රධානියා විශේෂයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි සැළකිලිමත් විය යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඩංගු පත්‍රිකා කිහිපයක් ද මේ සමඟ යා කර ඇත.

5.1 ආසන්න වශයෙන් තැපැල් ඡන්දහිමියන් 250 කට එක් සහතික කිරීමේ නිලධරයකු වශයෙන් නිලධාරීන් පත් කිරීම. (සියලුම ඡන්ද විමසීම්වලට පොදු උපදෙසකි.)

5.2 පසුගිය ඡන්ද විමසීම්වල දී සහතික කිරීමේ නිලධාරී වශයෙන් උනන්දුවෙන් හා නිවැරදිව රාජකාරි කළ අත්දැකීම් හා පළපුරුද්ද ඇති නිලධරයකු මෙම ඡන්ද විමසීම සඳහා ද පත් කිරීම.

5.3 පසුගිය ඡන්ද විමසීම්වලදී නොසැලකිල්ලෙන් කටයුතු කළ සහතික කිරීමේ නිලධාරීන් මෙවර එම තනතුර සඳහා පත් නොකිරීම.

5.4 තැපැල් මගින් ලැබෙන රක්ෂණ කවර සුරක්ෂිතව තමා භාරයේ තබා ගැනීමට පහසුකම් ඇති නිලධාරියකු මේ සඳහා පත් කිරීම.

5.5 තැපැල් ඡන්ද හිමියන්ට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක කාර්යාලයක පිහිටි අයකු එම තැපැල් ඡන්ද හිමියන්ගේ සහතික කිරීමේ නිලධාරී වශයෙන් පත් කිරීම.

5.6 විශේෂ දේශපාලන සම්බන්ධතා ඇති පුද්ගලයින් සහතික කිරීමේ නිලධාරී වශයෙන් පත් නොකිරීම.

5.7 තැපැල් ඡන්ද සම්බන්ධයෙන් පූර්ණ වගකීම සහතික කිරීමේ නිලධාරී වෙත පැවරෙන බැවින් වගකීම් දැරීමට හැකි නිලධාරීන් පමණක් සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීම.

5.8 තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය අනිවාර්යයෙන්ම අයදුම්පතෙහි සටහන් කිරීම.

තැපැල් ඡන්ද සහතික කරන නිලධාරීන් තමන් විසින් සහතික කරන ලද අයදුම්කරුවන්ගේ ලේඛනයක් (ඇමුණුම LAE/2019/09/F2) පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබාදිය යුතු අතර, තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කළ පසු ඒවා පිළිගත් / ප්‍රතික්ෂේප කළ බව දැන්වීම හා පිළිගත් තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු පැකැට්ටු එවීම සඳහා සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, තනතුර, කාර්යාල ලිපිනය (අනිවාර්යයෙන්ම නිල මුද්‍රාව මගින්) ඉල්ලුම් පත්‍රයෙහි සටහන් කරන ලෙසද උපදෙස් ලබා දෙන්න.

අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, සහතික කිරීමේ නිලධාරි විසින් සහතික කිරීමෙන් පසුව ඒවා ගාල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත යැවිය යුතු ය.

**තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම, ඒවා ඉදිරිපත් කිරීම හා සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමට අදාල කරුණු පමණක් මෙම චක්‍රලේඛයේ අඩංගු අතර තැපැල් ඡන්ද ක්‍රියාවලියට අවැසි සෙසු උපදෙස් හා කාර්ය පටිපාටි සහතික කිරීමේ නිලධාරීන් වෙනුවෙන් ඉදිරියේදී**
ලබා දෙනු ඇත.

මහින්ද දේශප්‍රිය
**සභාපති, මැතිවරණ කොමිෂන් සභාව**
**(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)**

**පිටපත්:**

01.සියළුම දිස්ත්‍රික් නි.මැ.කො./ ස.මැ.කො. වරුන් වෙත } කාරුණික දැ.ගැ.පි. හා දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීම පිණිස.

02.ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත - කාරුණික දැන ගැනීම පිණිස

ආදර්ශ ආකෘතිය

LAE/2019/09/F1

කාර්යාල ලිපිනය - ..........................................

..........................................

දිනය - ..........................................

තේරීම්භාර නිලධාරී,

ඇල්පිටිය ප්‍රාදේශීය සභාව.

**ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම -2019**
**තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම**

01. (අ) තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියාගේ නම ..........................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. තනතුර - ..........................................

03. (අ) සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය - ..........................................

(ආ) රාජකාරී ලිපිනය - ..........................................

(ඇ) රාජකාරී දුරකථන අංකය - .............................. (ඈ) ෆැක්ස් .............................. (ඉ) ඉ-තැපැල ..............................

04. (අ) පෞද්ගලික ලිපිනය - ..........................................

05. (ආ) දුරකථන අංක (ජංගම) - ..........................................

නිලධාරියාගේ ආදර්ශන අත්සන - ..........................................

තැපැල් ඡන්ද අයදුම්පත්වල
තබන ලද නිල මුද්‍රාවේ ආදර්ශය
ඉදිරි කොටුව මත තබන්න

06. තැපැල් ඡන්ද සහතික කරන්නේ කුමන ආයතනයක/ කාර්යාලයක/ තැපැල් ඡන්ද දායකයන් සම්බන්ධයෙන් ද යන වග - ..........................................

07. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී වශයෙන් ඉහත නිලධාරී තැන දළ වශයෙන් කොතරම් තැපැල් ඡන්ද දායකයින් ප්‍රමාණයකට (සංඛ්‍යාවකට) අදාළව මෙම රාජකාරී ඉටු කරන්නේ ද යන වග -

..........................................

08. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

ඉහත විස්තර සඳහන් නිලධාරී තැන ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියෙකු වශයෙන් මෙයින් පත්කරමි. ඔහුට අදාළ රාජකාරී සම්බන්ධයෙන් ඔහු දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් මෙයින් දන්වමි.

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී පත්කරනු ලබන නිලධාරියාගේ නම - ..........................................

..........................................

ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

තනතුර - ..........................................

දුරකථන අංක - කාර්යාලය: .............................. ජංගම:.............................. ෆැක්ස්:..............................

ඉ-තැපැල : ..........................................

අත්සන - ..........................................

නිල මුද්‍රව - ..........................................

(මෙම ආකෘතියේ සියලු විස්තර සම්පූර්ණ කළ යුතුය)

LAE/2019/09/F2

# ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය - 2019

## තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම් පිළිබඳ තොරතුරු

| අනු අංකය | තැපැල් ඡන්දදායකයාගේ නම | තනතුර | රාජකාරි ලිපිනය | සහතික කිරීමේ නිලධාරී වෙත තැපැල් ඡන්ද අයදුම් පත්‍ර ඉදිරිපත් කළ දිනය | තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාල තේරීම්භාර නිලධාරී වෙත යවන ලද දිනය | තැපැල් ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති පරිපාලන දිස්ත්‍රික්කය | අදාළ ඉල්ලුම්පත්‍රය අනුව තැපැල් ඡන්දදායකයා ලියාපදිංචි වී ඇති ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය හා අංකය, තම ඡන්ද කොට්ඨාශයේ අංකය හා නම ඡන්දදායකයාගේ අනුක්‍රමික අංකය | තේරීම්භාර නිලධාරී විසින් අයදුම්පත්‍ර පිළිගත් බව / ප්‍රතික්ෂේප කළ බව දන්වා ඇත්නම් ඒ තීරණ ලිපියේ විස්තර | තැපැල් ඡන්ද පත්‍රිකාව අඩංගු රක්ෂණ කවරය ලැබුන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |